සීමා සහිත ලංකා පොහොර සමාගමේ - (2024 ජූනි 30 දිනෙන් අවසන් මාස 03 සඳහා)

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස ලංකා පොහොර සමාගමේ ("සමාගම") 2024 ජූනි 30 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස තුන සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස තුන සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 ජූනි 30 දිනෙන් අවසන් මාස තුන සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 ජූනි 30 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස තුන සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 හි 32 ඡේදය ප්‍රකාරව වත්කම් හා වගකීම් හෝ ආදායම් හා වියදම් එකිනෙකට හිලව්කර මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් නොකළ යුතු වුවද, එක් බැංකු ගිණුමක අයිරා ශේෂය වූ රු.104,233,642 ක් අනෙකුත් බැංකු ගිණුම් ශේෂයන් සමඟ හිලව්කර මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.	එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයන්හිදී වත්කම් හා වගකීම් හෝ ආදායම් හා වියදම් එකිනෙකට හිලව් කර මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් නොකිරීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් හා වගකීම් හෝ ආදායම් හා වියදම් එකිනෙකට හිලව්කර මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් නොකළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 01 හි 69 ඡේදය ප්‍රකාරව වර්ෂයක කාලසීමාව ඉක්මවූ සියලුම වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම නොවන වගකීම් යටතේ දැක්විය යුතු වුවද, වර්ෂයක කාලය ඉක්මවූ රු.21,629,467 ක ණයහිමි ශේෂයක් ජංගම වගකීම් යටතේ ගිණුම්ගතකර තිබුණි.	එකඟ වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම වගකීම් ශේෂය තුළ අන්තර්ගතව ඇති රු.21,629,467 ක ණය හිමි ශේෂය වර්ෂයක කාල සීමාව ඉක්ම වූ ශේෂයක් බැවින් ඉදිරියේදි ජංගම නොවන වගකීම් යටතේ දැක්වීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන අයිතම ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 21 ඡේදය ප්‍රකාරව මූල්‍ය හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් පැනනගින මුදල් ගලාඒම් හා මුදල් ගලායෑම් වෙන වෙනම දැක්විය යුතු වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය තුළ දිගුකාලීන හා කෙටිකාලීන ණය ලැබීම් හා ගෙවීම්වල ශුද්ධ ශේෂය වූ රු.1,973,033,939 ක වටිනාකමක් හඳුනාගෙන තිබුණි.	එකඟ නොවේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ දිගු කාලීන හා කෙටි කාලීන ණය ලැබීම් හා ගෙවීම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය නොව වර්ෂය තුළ ගෙවීම් කරන ලද ණය වටිනාකම ලෙස රු.1,973,033,939 ක මුදල සටහන් අංක 26 යටතේ දක්වා ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන අයිතම ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 112 ඡේදය ප්‍රකාරව සමාගමට සිදුවී ඇති අලාභයන් අයකර ගැනීම සඳහා බාහිර පාර්ශවයන්ට එරෙහිව පැවරූ නඩු සහ බාහිර පාර්ශවයන් විසින් සමාගමට එරෙහිව පැවරූ නඩු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව්කර නොතිබුණි.	එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.	ප්‍රමිතිය ප්‍රකාරව සමාගමට පවතින නඩු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාලච්ඡේදයට අදාළ ගොඩනැගිලි, යන්ත්‍ර උපකරණ, කාර්යාල උපකරණ, පරිගණක උපකරණ හා රසායනාගාර උපකරණ යන වත්කම්හි ප්‍රවර්තන කාලච්ඡේදයට අදාළ ක්ෂය වටිනාකම පිළිවෙළින් රු.12,295,373, රු.228,830, රු.1,494,531, රු.2,134,614 හා රු.857,615 ක් වුවද, පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීමකට අදාළ වටිනාකම් ගැළපීමෙන් පසු අගයන් ලාභ/අලාභ ගිණුම තුළ ඇතුළත් කිරීම හේතුවෙන් කාලච්ඡේදයේ ලාභය රු.1,714,791 කින් අවතක්සේරු වී තිබුණි.	එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැළපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.	කාලච්ඡේදයේ ක්ෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාළ ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම රු.28,400,025 ක් වුවද මූල්‍ය ප්‍රකාශන තුළ රු.23,763,204 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් කාලපරිච්ඡේදයේ ලාභය හා ජංගම වත්කම් රු.4,636,821 කින් අවතක්සේරුවී තිබුණි.	එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැළපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.	කාලච්ඡේදයට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	ස්ථාවර තැන්පතු මත පොළී ආදායම ගණනය කිරීමේ උප ලේඛනයට අනුව සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාළ ස්ථාවර තැන්පතු මත පොළී ආදායම රු.92,034,223 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන තුළ රු.83,089,542 ක් ලෙස අඩුවෙන් ගිණුම්ගතකර තිබීම හේතුවෙන් කාලපරිච්ඡේදයේ ලාභය හා ජංගම වත්කම් රු.8,944,681 කින් අවතක්සේරු වී තිබුණි.	එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැළපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.	කාලච්ඡේදයට අදාළ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	2024 ජුනි 30 දිනට ලැබිය යුතු පොළී ගිණුමේ ශේෂය වන රු.166,919,973 ක් භාණ්ඩාගාර බිල්පත් වටිනාකම තුළ ඇතුළත්ව තිබීම හේතුවෙන් භාණ්ඩාගාර බිල්පත් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැළපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	සමාගමේ අස්පෘශ්‍ය වත්කම් 2024 මාර්තු 31 දින වන විට ක්‍රමක්ෂය කිරීම සම්පූර්ණකර තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහ ගලා ඒම් තුළ අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය ලෙස රු.396,479 ක වටිනාකමක් බදු පෙර ලාභයට ගැළපීම් කර තිබුණි.	එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැළපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.	කාලච්ඡේදයට අදාළ වියදම් පමණක් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	පෙර වර්ෂයේ ගිණුම්කරණ වරදක් නිවැරදි කිරීම සඳහා ගළපන ලද රු.1,988,041 ක ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදු පෙර ලාභයට ගැළපීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වන මුදල් ප්‍රවාහ ගලාඒම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැළපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ පෙර වර්ෂයේ ගැළපීම් නිවැරදිව සිදුකළ යුතුය.

(උ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහ ගලාඒම් තුළ කාරක ප්‍රාග්ධන වෙනස ගැලපීමේ දී තැන්පතු හා අත්තිකාරම් ගිණුම් ශේෂවල වෙනස 285,252 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වන මුදල් ගලා ඒම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	එකඟ නොවේ. තැන්පතු හා අත්තිකාරම් ගිණුම් වල වෙනස වනුයේ විලම්භිත පොලී ආදායමයි. එය ගැලපීම හේතුවෙන් මෙම වෙනස ඇති වී තිබේ.	කාරක ප්‍රාග්ධන වෙනස නිවැරදිව ගැළපීම් කළ යුතුය.
(ඌ)	2024 අප්‍රේල්, මැයි සහ ජූනි යන මාස 03 ක කාලච්ඡේදයේදී සමාගමේ දිගුකාලීන ණය පියවීමට අදාළ රු.1,976,992,849 ක වාරික ගෙවීම් කෙටිකාලින ණය ගිණුමේ ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් ඌණගණනය වී ඇති අතර ජංගම නොවන වගකීම් අධිගණනය වී තිබුණි.	එකඟ නොවේ. 2024 අප්‍රේල් 01 සිට 2025 මාර්තු 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා වන දිගු කාලීන ණය ප්‍රමාණය කෙටි කාලීන ණය ගිණුමට මාරු කර ඇත. කෙටි කාලීන ණය ජංගම වගකීම් යටතේ දක්වා ඇති හෙයින් මෙම රු.1,976,992,849 ක වාරික ගෙවීම් කෙටි කාලීන ණය ගිණුමේ ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ජංගම වගකීම් ඌණගණනය වී නොමැති අතර ජංගම නොවන වගකීම් අධිගණනය වීද නොමැත.	වගකීම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය.
(එ)	කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ ඇතිකරගත් ගිවිසුමකට අනුව සමාගම විසින් අලෙවි කරන තේ කිලෝ ග්‍රෑම් 50 මිශ්‍ර පොහොර මිටියක් සඳහා රජය විසින් ලබා දෙනු ලබන රු.2,000 ක වටිනාකම සමාගමේ විකුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් නොකර විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී පොහොර සහනාධාර ලෙස ඒ යටතේ අඩුකර දැක්වීම හේතුවෙන් කාලච්ඡේදයේ විකුණුම් වටිනාකම රු.38,052,000 කින් මූල්‍ය ප්‍රකාශන තුළ අඩුවෙන් දක්වා තිබුණි.	එකඟ නොවේ. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ ඇති කර ගත් ගිවිසුමට අනුව 2024 පෙබරවාරි මස කි.ග්‍රෑම් 50 මිටියකට රු.2,000 බැගින් රු.මිලියන 120 ක සහනාධාර මුදලක් තේ මණ්ඩලය මඟින් සමාගම වෙත ලබා දී තිබුණි. ඉන්වොයිස්පත් නිකුත් කරනු ලබන්නේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙතය. ඒ අනුව ඉන්වොයිස්පත් මඟින් නිකුත් කරනු ලබන පොහොර වලට අදාළ මළු ප්‍රමාණයට සමාන සහනාධාර වටිනාකම ගිණුම් කාලපරිච්ඡේදය අවසානයේදී ලැබිය යුතු සහනාධාර ගිණුමෙන් ඉවත් කරනු ලබයි. මෙහිදී රු.2,000 ක් වූ සහනාධාර මුදල වෙනුවෙන් ඉන්වොයිස්පත් නිකුත් කිරීමක් සිදු නොකරන හෙයින් විකුණුම් ගිණුමට ගැලපීමක් සිදු නොකරයි. තේ මණ්ඩලය හරහා සහනාධාර මුදල් ලැබීමේදී VAT	කාලච්ඡේදයට අදාළ ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගත යුතුය.

ඉන්වොයිස්පතක් නිකුත් කිරීමක් සිදු නොවන අතර කැබිනට් මණ්ඩල අනුමැතිය මත එම සහනාධාර මුදල අප වෙත ලබා දීම සිදු කර ඇත. කෙසේ වෙතත් තේ පොහොර වටිනාකමෙහි ඉතිරි මුදල කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් ලබා ගන්නා බැවින් ඒ සඳහා පමණක් වෙන වෙනම VAT ඉන්වොයිස්පත් නිකුත් කරන අතර එය විකුණුම් ලෙස ගිණුම්ගත කරනු ලැබේ. සහනාධාර මුදල සඳහා VAT අය නොකරන බැවින් විකුණුම් ලෙස සටහන් නොකර විකුණුම් පිරිවැයෙන් අඩු කිරීමට කටයුතු කර ඇත.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පොළී ආදායම්	120,901,686	130,446,238	9,544,552	එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.	කාලච්ඡේදයට අදාළ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
වන්දි මුදල්	1,009,100	805,910	203,190	එකඟ නොවේ. අනිවාර්යය විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය යටතේ සේවයෙන් ඉවත්ව ගිය වැ.අ.863 දරණ නිළධාරීගේ සේවා කාලය අවු.17 කි. මෙහිදී වන්දි මුදල රු.805,910 ක් ලෙස ගණනය කර ඇත්තේ සේවා කාලය අවු.11 ලෙස සැලකීමෙනි. නමුත් පසුව මොහුගේ සේවා කාලය නැවත තහවුරු කිරීමෙන් පසුව ඊට අදාළව ගණනය කරන ලද රු.1,009,100 ක නිවැරදි වන්දි මුදල ගෙවා ඇත.	මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ශේෂ අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය.

1.5.4 අධිකාරී බලය නොලත් ගණුදෙනු

	අධිකාරී බලය නොලත් ගණුදෙනුව	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 මාර්තු 31 දිනට මහජන බැංකුවෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස දැක්වුණු රු.848,248 ක් පොත් වලින් කපා හැර තිබූ අතර ඊට අදාළ අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවීය.	එකඟ වේ. අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.	ලැබිය යුතු ශේෂ පොත් වලින් ඉවත් කිරීමට අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය.

1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනෙකුත් බෝග සඳහා වන පොහොර වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු සහනාධාර ලෙස 2018 වර්ෂයේ සිට ගිණුම්ගතකර ඇති රු.62,181,400 සම්බන්ධයෙන් වන තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයේ නිවැරදිතාවය පිළිබඳව විගණනයට තහවුරුකළ නොහැකි විය.	එකඟ වේ. මෙම මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය හා ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත 2025 බැඳීම් බැරකම් මඟින් ඉල්ලුම් කර ඇත.	ශේෂ තහවුරුකිරීම් ලබාගත යුතුය.
(ආ)	වර්ෂ 02 සිට වර්ෂ 03 දක්වා කාල පරාසයක් අය නොවී පවතින ගොවිජන සේවා මධ්‍යස්ථාන 224 ක් වෙතින් සමාගමට අයවිය යුතු එකතු වටිනාකම රු.61,408,774 ක් වූ ණය ශේෂ අදාළ පාර්ශවයන් විසින් විගණිත දින වන විටත් තහවුරුකර නොතිබුණි.	එකඟ වේ. මෙම මූල්‍ය වාර්තා ඉදිරිපත් කරනු ලැබුයේ ත්‍රෛමාසික කාලපරිච්ඡේදයකට බැවින් ඉදිරි ගිණුම් වර්ෂයේදී ශේෂ තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.	ශේෂ තහවුරු කරගෙන අයකර ගැනීම් කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පොහොර අලෙවිය මත ඇති වූ වර්ෂ 03 කට වඩා කල්ගත වී ඇති විවිධ පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු එකතු වටිනාකම රු.56,002,544 ක් හා වර්ෂ 10 ඉක්මවූ රු.87,380,655 ක ශේෂ සමාලෝචිත කාලච්ඡේදය අවසාන වනවිටත් අයකර ගැනීමට සමාගම විසින් කටයුතුකර නොතිබුණි.	එකඟ වේ. මෙම දියර පොහොර බෙදාහරින්නන්ගෙන් අයවිය යුතු රු.42,952,277 ක මුදල සම්බන්ධයෙන් වූ නඩුව අනුව රු.60,000 ක මුදල නඩු තීන්දුවක් මත බෙදාහැරීම් නියෝජිතයෙකු වෙත නැවත ලබා දිය යුතු මුදලක් බැවින් සෘණ ශේෂයක් පෙන්නුම් කෙරේ. එම මුදල නැවත ලබා දිමට කටයුතු කරනු ලැබේ. බලයලත් වෙළඳ නියෝජිතයන්ගෙන් අයවිය	අයවිය යුතු මුදල් අයකර ගත යුතුය.

		යුතු වසර 10 හා 6 ඉක්ම වූ ණය ශේෂයන් සඳහා ශේෂ තහවුරු කිරීම් ලිපි යොමු කළද තහවුරු කිරීම් ලිපි ලැබෙන්නේ ඉතා සුළු ප්‍රමාණයකි. එසේම 347,119 ක මුදල ලද පාර්ශවය තහවුරු කර ගැනීමේ හැකියාවක් ද නොමැත. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙම තොරතුරු ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. මෙහි සඳහන් රාජ්‍ය ආයතන වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව යන ආයතන දෙක සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කර එම මුදල් ලබා ගැනීමට දිගින් දිගටම ලිපි යොමු කරමින් පවතී. අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකගෙන් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර එහි විමර්ෂණ කටයුතු සිදු වෙමින් පවතී. එමෙන්ම පැලවත්ත සීනි සමාගමෙන් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් දිගින් දිගටම අයකිරීම් කටයුතු සිදු කිරීමට එම ආයතනය සමඟ සම්බන්ධ වී පරීක්ෂා කිරීම් සිදු කරන ලදී. එසේම ඉබ්බාගමුව වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් 2025 බැදීම් බැරකම් ඉල්ලුම් කිරීමේදී සඳහන් කර ඇත.	
(ආ)	ගබඩා නිලධාරීන්ගේ තොග ඌනතා හේතුවෙන් තව දුරටත් අයවිය යුතු ශේෂය රු.7,933,189 ක් විගණිත දින වන විටත් අයකරගෙන නොතිබුණි.	එකඟ වේ. පොතුවිල් තොග නිලධාරීගේ ඌණතාවය වන රු.7,694,938.31 සඳහා ගම්පහ දිසා අධිකරණයේ නඩු පවරා ඇති අතර නියෝගය ලබා දීමට නියමිතව ඇත. හුණුපිටිය ගබඩා සංකීර්ණයේ තොග ඌණතාවයෙන් රු.2,144,259 ක මුදලක් අයකර ගෙන ඇති අතර තවදුරටත් අය නොවී පවතින රු.238,251 ක මුදල සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගෙන ගිණුම් වලින් ඉවත් කර ගැනීමට කටයුතු කරනු ඇත.	අයවිය යුතු ශේෂයන් නොපමාව අය කරගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2017 වර්ෂයේ සමාගමක් විසින් පුද්ගලික සමාගමක් සමඟ ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව මිලදී ගන්නා ලද කාබනික දියර පොහොර වලට අදාළව සිදුවූ අලාභය සඳහා එම සමාගමෙන් අයවිය යුතු රු.82,986,150ක මුදල විගණිත දින වන විටත් අයකර ගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි.	එකඟ වේ. මෙම මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.	අයවිය යුතු ශේෂ නොපමාව අය කරගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	2021 වර්ෂයේදී යූරියා පොහොර තොගයක් ආනයනයට අදාළව බැංකුව විසින් සමාගමේ බැංකු ගිණුමෙන් අයකරන ලද රු.3,258,480 ක නැව් සුරක්ෂණයක් ලැබිය යුතු වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබුණද එම වටිනාකම අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.	එකඟ වේ. මෙය කෝවිඩ් වසංගත සමයේ සිදු වූ ගනුදෙනුවක් වන අතර බැංකුව සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු කරනු ලැබේ.	ලැබිය යුතු ශේෂයන් අයකර ගත යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය පොහොර ගබඩාවන්හි තොග නිලධාරීන් හා අලෙවි විධායක නිලධාරීන් විසින් සිදුකරන ලද විවිධ අක්‍රමිකතා හේතුවෙන් සමාගම විසින් නඩු පවරා 2014 වර්ෂයේ සිට වරින් වර අයකරගන්නා ලද එකතු වටිනාකම රු.18,043,059 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.	එකඟ වේ. මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට මෙන්ම මහාභාණ්ඩාගාරයෙන් ලැබීමටද වටිනාකම් ඇති හෙයින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ඉදිරි කටයුතු කරනු ලැබේ.	අයකර ගන්නා ලද වටිනාකම් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුය.
(ආ)	පොහොර සහනාධාර ක්‍රමය යටතේ අලෙවි කළ (ටී.එස්.පී) පොහොර මෙ.ටොන් 1,333 ක් සමාගමට පවරා ගැනීමට අදාළව භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු රු.83,000,000 ක් සමාලෝචිත කාලච්ඡේදය අවසාන වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි.	එකඟ නොවේ. පොහොර සහනාධාර ක්‍රමවේදය යටතේ ආනයනය කළ ටී.එස්.පී පොහොර මෙ.ටො.1,333 ක් සමාගමට පවරා ගෙන මහාභාණ්ඩාගාරය වෙත ගෙවීම් කිරීම පිණිස වෙන් කරන ලද රු.මිලියන 83 ක මුදල ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොමැත්තේ මෙතෙක් පවරා ගැනීමේ අනුමැතිය ලැබී නොමැති හෙයිනි.	සහනාධාර ක්‍රමය යටතේ සමාගමේ තොගයට ඇතුළත් කළ පොහොර වටිනාකම භාණ්ඩාගාරයට ප්රේෂණය කළ යුතුය.
(ඇ)	2023 වර්ෂයේ සිට ඉන්දියානු ණය ආධාර යටතේ ආනයනයකර ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා අලෙවිකළ යූරියා පොහොර වෙනුවෙන් රු.9,450,399 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.	එකඟ වේ. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට ඉල්ලීම් සිදු කර ඇති අතර තහවුරු කර ගැනීමෙන් පසුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	ඉන්දියානු ණය ආධාර පොහොර වෙනුවෙන් වූ වටිනාකම් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය.
(ඈ)	වර්ෂ 01 සිට 07 දක්වා කාලයක් තුළ සමාගමට සේවා සපයන ලද කොන්ත්‍රාත්කරුවන් විසින් හිමිකම් නොපෑ රු.3,020,530 ක ආපසු ගෙවනු ලබන ලංසු ඇපකර පිළිබඳ	එකඟ වේ. මෙහිදී එක් එක් කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දීම් සිදු කර ශේෂ තහවුරු කර ගැනීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව ආදායමට ගැලපීමට කටයුතු කරනු ලැබේ.	ගෙවිය යුතු වටිනාකම් තහවුරු කරගැනීමෙන් පසු හිමිකම් නොපාන්නේ නම්

සොයාබලා හිමිකම් නොපාන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආදායමට ගැනීමට කටයුතු කිරීමකින් තොරව දීර්ඝ කාලයක සිට ජංගම වගකීමක් ලෙස නිරූපණය කර තිබුණි.		සමාගමේ ආදායමට හඳුනා ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත කාලච්ඡේදයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.475,536,320 ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් මාස තුනක කාලච්ඡේදයේ ලාභය රු.35,269,729 ක් විය. (පසුගිය වර්ෂයේ ලාභය/4) ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.440,266,591 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනිවාර්ය විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය යටතේ සේවයෙන් ඉවත්ව ගිය සේවකයන් වෙනුවෙන් ගෙවූ වන්දි මුදල් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පරිසර හිතකාමී දේශීය පොහොර මිලදී ගැනීමේ ව්‍යාපෘතිය යටතේ 2021/2022 වර්ෂයේ මිලට ගෙන නොවිකිණී ඉතිරිව පවතින කාබනික පොහොර අම්පාර, හොරොව්පතාන,මැදවච්චිය, නොච්චියාගම, බදුල්ල, මඩකලපුව, දෙහිගහලන්ද, කොණ්ඩාවිල්, හිඟුරක්ගොඩ හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ගබඩාවන් වල වැඩි වශයෙන් පවතින බව 2025 මාර්තු මාසයේ පැවැත්වූ වාර්ෂික තොග සත්‍යාපනයේදී නිරීක්ෂණය විය. 2025 මැයි 08 දිනට මෙසේ අලෙවි නොවී ඉතිරිව පවතින කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය මෙ.ටොන් 2,487 ක් වන අතර එහි වටිනාකම රු.32,835,355 කි. එසේ වුවද විගණිත දිනය වන විටත් මෙම පොහොර සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.	එකඟ වේ. විමසුමේ සඳහන් කරන ලද කමිටු වාර්තාව පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශයේ දී 2025.06.11 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේදී ද සාකච්ඡාවට බඳුන් වූ අතර එහිදි ලබා ගන්නා ලද තීරණයන්හි සටහන් අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.	කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නිෂ්කාර්ය පිරිවැය අවම කළ යුතුය.